# රත්තොට කොට්ඨාශයේ

## කාබනික පොහොර (කොම්පෝස්ට් හා දියර පොහොර)

# නිෂ්පාදකයින් දිරිගැන්වීම









රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**01.ව්‍යාපෘතියේ නම:-** රත්තොට කොට්ඨාශයේ කාබනික පොහොර (කොම්පෝස්ට් හා දියර පොහොර) නිෂ්පාදකයින් දිරිගැන්වීම

## 02. හැදින්වීම

රත්තොට කොට්ඨාශය කෘෂිකාර්මික කලාපයක් වන අතර එහි පස, දේශගුණික සාධක හා භූගෝලීය පිහිටීම කෘෂිකර්මික කටයුතු සඳහා වඩාත් යෝග්‍ය වේ. දැනට රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල කාබනික පොහොර මෙන්ම රසායනික පොහොර යන දෙවර්ගයම භාවිතය දක්නට ලැබේ. වර්තමානයේදී රසායනික පොහොර භාවිතයෙන් වගා කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ වකුගඩු රෝගීන් හා පිළිකා රෝගින් වාර්තා වීම සිඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. මේ හේතුවෙන් මෙම රෝගීන්ට ප්‍රතිකාර කටයුතු සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය වැඩිවී ඇත.

සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කාබනික පොහොර වගාව ප්‍රචලිත කිරීම මූලික අරමුණු අතර පවතී. එහිදී රසායනික පොහොර ආනයනයට යන පිරිවැය අවම කිරිම, ජනතාවට සෞඛ්‍යාරක්ෂිත ආහාර පරිභෝජනයට අවස්ථාව සලසාදීම, අපතේ යන අමුද්‍රව්‍ය තුලින් ආදායමක් ලබා ගැනීමට හැකිවීම, වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම තුලින් අඩු ආදායම් ලාභීන්ගේ ආදායම් තත්වය ඉහල නැංවීමට හැකිවීම, කාබනික පොහොර භාවිතය මඟින් පරිසරයට හිතකර ජීවීන් සුරක්ෂිතවීම ආදි සෙසු කරුණු ලඟාකර ගැනීම සඳහා රජය විසින් මෙම නව ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා ඇත. රසායනික පොහොර භාවිතය මඟින් භූගත ජලය අපවිත්‍ර වීම, පස නිසරුවීම හා සෞඛ්‍ය ආරක්ෂිත නොවන කෘෂි නිෂ්පාදන පරිභෝජනය වැඩිවීම සිදුවේ. රසායනික පොහොර වලට සාපේක්ෂව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැයවන පිරිවැය අවම වන අතර කාබනික පොහොර භාවිතයෙන් ජනතාවට සෞඛ්‍යාරක්ෂිත ආහාර පරිභෝජනයට හැකියාව ලැබේ. එබැවින් කාබනික පොහොර භාවිතය රටේ කාලීන අවශ්‍යතාවයක් බවට පත්වී ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් රත්තොට කොට්ඨාශයේ රසායනික පොහොර භාවිතය අවම කොට සෞඛ්‍ය ආරක්ෂිත ආහාර නිෂ්පාදන ක්‍රියාවලියකට යොමු වීමත් කොට්ඨාශයේ කාබනික පොහොර අවශ්‍යතාවය කොට්ඨාශය තුලින්ම සපුරා ගැනීමත් අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය මඟින් ජනිත කරන අතිරික්ත කාබනික පොහොර අලෙවි මධ්‍යස්ථානයක් රත්තොට කිවුල උල්පතපිටිය වසමේ රජයේ ඉඩමක් තුල ඉදිකිරීම මඟින් මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට, උකුවෙල, මාතලේ කොට්ඨාශවල කාබනික පොහොර නිෂ්පාදකයින්ට පහසුවෙන් තම නිෂ්පාදන අලෙවි කිරීමේ හැකියාව සැලසේ.

කාබනික පොහොර නිෂ්පාදකයින් සවිබල ගැන්වීමේ අරමුණින් සමෘද්ධි හා ක්ෂුද්‍ර මූල්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් 70 ක් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා දියර පොහොර නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ ලබාදීමටත් ඔවුන්ගේ අලෙවි කටයුතු සැලසීමටත් අපේක්ෂා කෙරේ.

## 03. පිහිටීම

දිස්ත්‍රික්කය :- මාතලේ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- රත්තොට

ග්‍රාම නිලධාරි වසම් :- බණ්ඩාරපොල, අල්වත්ත, දොඹගොඩ, වරාපිටිය, එපිටමුල්ල, වැටැස්යාය, ඉහල ඕවල, පහල ඕවල, උඩවේරගම

**04. ව්‍යාපෘතියේ පසුබිම**

රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත් වන 63070 ක් පමණ වන මුළු ජනගහනයෙන් 75% කට වැඩි කොටසකගේ ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි. එහිදී වී වගාව, අතිරේක ආහාර බෝග වගාව හා සුළු අපනයන බෝග වගාව මෙන්ම සත්ත්ව පාලනය ආදී කෘෂිකාර්මික කටයුතු වල නියලේ. දැනට රත්තොට කොට්ඨාශයේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්. 568 හා අපනයන කෘෂිකර්ම බෝග ප්‍රමාණය හෙක්. 947 වේ. කොට්ඨාශය තුල පවතින හෙක්. 568 ක් පමණ වන කුඹුරු ඉඩම් සඳහා අවශ්‍ය වන රසායනික පොහොර අවශ්‍යතාව දළ වශයෙන් යූරියා කි.ග්‍රෑ. 101360, T.S.P කි.ග්‍රෑ.14000 හා M.O.P. කි.ග්‍රෑ. 29680 පමණ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රමිතියෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ප්‍රධාන අරමුණ වන අතර මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගොවීන් විසින්ම සපයා ගැනීමට අපේක්ෂිතය. ගිලිඩිසීරියා, නත්තසූරිය, ඉලුක්, ගිනි තණ, පිදුරු, ඉවත ලන කෙසෙල් බොඩ, එළු, කුකුල්, ගව අපද්‍රව්‍ය යොදා ගනිමින් ප්‍රමිතියෙන් යුතු කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම හා සුළු වශයෙන් දියර පොහොර නිෂ්පාදනය සෞභාග්‍යා සන්නාමය යටතේ සිදු කිරීමට අපේක්ෂිතය. මෙම පොහොර නිෂ්පාදනය මඟින් ස්වාභාවිකවම වල් පාලනය නිරන්තරයෙන් සිදුවෙන අතර කොට්ඨාශය තුල ජනිත වන ඉවතන ලන කෘෂිකාර්මික ද්‍රව්‍ය යොදා ගැනිම මඟින් එම ගොවීන්ට ද අමතර ආදායමක් ලබාදීමට හැකියාව ලැබේ. දියර පොහොර නිෂ්පාදනය කර ආරක්ෂිත ගෘහ තුල සිදු කරගෙන යනු ලබන වගාවන් වන සලාද, තක්කාලි, බෙල් පෙපර්, ගර්කින් සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය. කාබනික පොහොර නිෂ්පාදනය කිරිමට කැමැත්තක් දක්වන අඩු ආදායම් ලාභී ගොවි මහතුන් හඳුනා ගැනීම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මඟින් හඳුනා ගැනීමට අපේක්ෂිතය. ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම හා පුහුණුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මාකඳුර පර්යේෂණ ආයතනය මඟින් ලබා ගැනීමට අපේක්ෂිතය. රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර යොදා ගැනීම මඟින් අවම පිරිවැයක් තුලින් වැඩි අස්වැන්නක් හා වැඩි ආදායමක් ලබා ගැනීමට හැකියාව ඇත.

## 05. අරමුණු

- කාබනික පොහොර නිෂ්පාදකයන් බිහිකිරීම තුලින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය තුලින් රත්තොට කොට්ඨාශය ස්වයංපෝෂිත කිරීම හා රසායනික පොහොර අවම කිරීම.
- රත්තොට කොට්ඨාශයේ කාබනික ආහාර බෝග වගාව තුලින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම.
- කර්මාන්තයේ නියලෙන කාන්තාවන් සඳහා ශක්තිමත් ආර්ථිකයක් ඇති කිරීම.
- පාංශු හායනය අවම කොට පාංශු සංරක්ෂණය වැඩි දියුණු කිරීම

## 07. ප්‍රතිලාභීන්

**ඍජු ප්‍රතිලාභීන් :-** කාබනික පොහොර නිෂ්පාදකයින් ( ප්‍රතිලාභීන් 70)

**වක්‍ර ප්‍රතිලාභීන් :-** රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවීන් සහ අමුද්‍රව්‍ය සපයන පුද්ගලයින්, කාබනික පොහොර අලෙවිකරුවන් හා සත්ත්ව පාලනය සිදු කරන ගොවීන්.

## 08.ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය

- කාබනික පොහොර නිෂ්පාදකයින් හඳුනාගැනීම
  මේ වන විට ප්‍රතිලාභීන් හඳුනාගෙන අවසන් අතර ඔවුන් විසින් මේ වන විටත් කාබනික පොහොර නිෂ්පාදනය සිදුකරගෙන යනු ලබයි.
- කාබනික පොහොර නිෂ්පාදකයින්ගේ සමිතියක් පිහිටුවීම.
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය දැනුම හා තාක්ෂණය ලබාදීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාකඳුර පර්යේෂණ ආයතනය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය පිලිබඳව විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- අවශ්‍ය උපකරණ හඳුනාගැනීම හා ප්‍රතිලාභීන් වෙත ලබාදීම. (මේ වන විටත් අවශ්‍ය උපකරණ හඳුනාගෙන අවසන්)
- කාබනික පොහොර නිෂ්පාදනය හා ගබඩා කිරීම සඳහා මඩුවක් සකසා දීම.
- කාබනික පොහොර ගබඩා කිරීමට හා අලෙවියට අලෙවි මධ්‍යස්ථානයක් ඇති කිරිම.
- සෞභාග්‍යා වෙළඳ නාමය යටතේ විධිමත් ඇසුරුමකින් කාබනික පොහොර හා දියර පොහොර වෙළඳපලට නිකුත් කිරීම.
- පසු විපරම් කටයුතු සිදුකිරීම.

**රත්තොට කොට්ඨාශයේ 2021 සිට 2023 දක්වා අපේක්ෂිත කාබනික පොහොර නිෂ්පාදන සැලැස්ම**

| අනු අංකය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන වසම් | ගොවීන් ගණන | අපේක්ෂිතනිෂ්පාදන ප්‍රමාණය 2021 (වර්ෂය) කි.ග්‍රෑ | | අපේක්ෂිතනිෂ්පාදන ප්‍රමාණය 2022 (වර්ෂය) කි.ග්‍රෑ | | අපේක්ෂිතනිෂ්පාදන ප්‍රමාණය 2023 (වර්ෂය) ක.ග්‍රෑ | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඝණ පොහොර | දියර පොහොර | ඝණ පොහොර | දියර පොහොර | ඝණ පොහොර | දියර පොහොර |
| 1 | බණ්ඩාරපොල | 5 | 27500 | 2500 | 55000 | 5000 | 82500 | 7500 |
| 2 | අල්වත්ත | 4 | 22000 | 2000 | 44000 | 4000 | 66000 | 6000 |
| 3 | වරාපිටිය | 5 | 27500 | 2500 | 55000 | 5000 | 82500 | 7500 |
| 4 | දොඹගොඩ | 5 | 27500 | 2500 | 55000 | 5000 | 82500 | 7500 |
| 5 | එපිටමුල්ල | 14 | 77000 | 7000 | 154000 | 14000 | 231000 | 21000 |
| 6 | වැටස්යාය | 6 | 33000 | 3000 | 66000 | 6000 | 99000 | 9000 |
| 7 | ඉහළ ඕවල | 6 | 33000 | 3000 | 66000 | 6000 | 99000 | 9000 |
| 8 | පහළ ඕවළ | 5 | 27500 | 2500 | 55000 | 5000 | 82500 | 7500 |
| 9 | උඩවේරගම | 20 | 110000 | 10000 | 220000 | 20000 | 330000 | 30000 |
| එකතුව | | 70 | 385000 | 35000 | 770000 | 70000 | 1155000 | 105000 |

සටහන:-

2021 වර්ෂය-එක් ගොවියෙකු විසින් කාබනික පොහොර (කොම්පෝස්ට්) කි.ග්‍රෑ 5500 ත් දියර පොහොර ලීටර් 500 නිෂ්පාදනය කරයි.

2022 වර්ෂය-එක් ගොවියෙකු විසින් කාබනික පොහොර (කොම්පෝස්ට්) කි.ග්‍රෑ 11000 ත් දියර පොහොර ලීටර් 1000 නිෂ්පාදනය කරයි.

2023 වර්ෂය-එක් ගොවියෙකු විසින් කාබනික පොහොර (කොම්පෝස්ට්) කි.ග්‍රෑ 16500 ත් දියර පොහොර ලීටර් 1500 නිෂ්පාදනය කරයි

## 09. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය

**ඉහත සඳහන් ක්‍රමවේදයට අනුව පහත වගුවේ සඳහන් වසම්වල ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.**

| අනු අංකය | වසම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | බණ්ඩාරපොල | 5 |
| 2 | අල්වත්ත | 4 |
| 3 | වරාපිටිය | 5 |
| 4 | දොඹගොඩ | 5 |
| 5 | වැටැස්යාය | 6 |
| 6 | එපිටමුල්ල | 14 |
| 7 | ඉහල ඕවල | 6 |
| 8 | උඩවේරගම | 20 |
| 9 | පහල ඕවල | 5 |
| | **එකතුව** | 70 |

## 10. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ

- ප්‍රදේශයේ ජනතාවට වස විසෙන් තොර ආහාර පරිභෝජනයට අවස්ථාව උදාවීම.
- පොහොර නිෂ්පාදනය කරන්නන්ගේ හා අලෙවිකරනන්ගේ ආදායම ඉහල නැංවීම
- සෞභාග්‍යයේ දැක්මට දායක වෙමින් කාබනික ගොවිතැන කරා ගොවින් යොමු කරවීම.

- ප්‍රදේශයේ කාන්තාවන් ආදායම් ඉපයීමට යොමුවීම.
- ගොවීන්ගේ කාබනික පොහොර අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකියාව ලැබීම හා කාබනික පොහොර වලට යන වියදම අවමවීම.
- අපතේ යන අපද්‍රව්‍ය වලින් ප්‍රයෝජනයක් ගත හැකි වීම.

## 11. ව්‍යාපෘතිය අධීක්ෂණය හා පසුවිපරම

- සමෘද්ධි හා ක්ෂුද්‍ර මූල්‍ය අමාත්‍යාංශය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රත්තොට
- බණ්ඩාරපොල / වේරගම ගොවිජන සංවර්ධන නිලධාරීන්
- අදාල කෘෂිකර්ම උපදේශන කොටස භාරව සිටින කෘෂිකර්ම උපදේශකවරුන්
- අප නිරීක්ෂණ චාරිකාව සිදු කල දින රැස්වී සිටි පිරිස සමග සාකච්ඡා කර සෞභාග්‍යා කාබනික පොහොර හා කාබනික දියර පොහොර නිෂ්පාදකයන්ගේ සමිතිය නමින් නව සමිතියක් පිහිටුවා ගැනීමට අපේක්ෂා කෙරේ. සියළු ආධාර උපකාර සමිතිය හරහා සිදු කිරීමටත් සමිතියේ අධීක්ෂණ කටයුතු වසමේ සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන්ට පවරනු ලැබේ.

## 12. කාල රාමුව :

| අනු. අංකය | ක්‍රියාවලිය | 2021 වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ජුනි | ජුලි | අගෝ | ඔක් | නොවැ | දෙසැ | ජන |
| 01 | ව්‍යාපෘති වාර්තාව සැකසීම හා අනුමැතිය ලබා ගැනීම. | | | | | | | |
| 02. | කාබනික පොහොර නිෂ්පාදකයින් හඳුනාගැනීම හා සමිති පිහිටුවීම | | | | | | | |
| 03 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | | | | | |
| 04 | ප්‍රතිලාභීන් වෙත උපකරණ ලබාදීම හා කාබනික පොහොර නිෂ්පාදනයට මඩුවක් බැගින් ඉදිකිරීම | | | | | | | |
| 05 | කාබනික පොහොර අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම | | | | | | | |
| 07 | ඇසුරුම්කරණය හා වෙළඳපොල වෙත යොමු කිරීම | | | | | | | |
| 08 | පසු විපරම් කටයුතු සිදු කිරීම | | | | | | | |

## 13. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දළ වියදම් ඇස්තමේන්තුව :

* එක් ප්‍රතිලාභියකු සඳහා දළ වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුව |
|---|---|---|
| | **ප්‍රතිලාභියා විසින් දරණ දායකත්වයේ වටිනාකම කාබනික පොහොර නිෂ්පාදන අමුද්‍රව්‍ය, උපකරණ, ශ්‍රම දායකත්වය** | රු 100,000.00 |
| | එකතුවඑකතුව | රු 100,000.00 |
| | | |

## ප්‍රතිලාභින් 70 සදහා දළ වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | ක්ෂේත්‍රය | දළ ඇස්තමේන්තුවරු. |
|---|---|---|
| 01. | ප්‍රතිලාභින් විසින් දරන දායකත්ව වටිනාකම<br>ප්‍රතිලාභින් 70*100,000 | 7,000,000.00 |
| 02 | මාකදුර පර්යේෂණ මධ්‍යස්ථානයේ පුහුණු වැඩමුළුව (ප්‍රතිලාභීන් ප්‍රවාහණය රු80,000/දිවා ආහාරය/තේ රු.35000/ ,ලිපි ද්‍රව්‍ය රු.10,000/, පාඨමාලා ගාස්තුව රු 80,000 ) | 205,000.00 |
| 03. | උපකරණ ලබා දීම (රු. 40,000.00 * 70)<br>(උදළු මුල්ලු,වල් කපන යන්ත්‍ර,උදළු,සවල්,වීල් බැරෝ,ඇසුරුම්,ඊ ආර් පී කුඩු,සණකම(gauge300)ඉටිරෙදි,දියර පොහොර සදහා බැරල් හා බාල්දි ප්‍රතිලාභීන් 70 සදහා) | 2,800,000.00 |
| 04 | කාබනික පොහොර ගබඩා කිරීම සදහා මඩුවක් ඉදි කරීම (රු. 60,000.00 * 70)<br><br>ප්‍රතිලාභීන් 70 සදහා -අඩි 10*10 මඩු 1 බැගින් | 4,200,000.00 |
| 05 | කාබනික පොහොර අලෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීම කිවුල උල්පතපිටිය වසම | 2,000,000.00 |
| | ව්‍යාපෘතිය සදහා මුළු පිරිවැය | 16,205,000.00 |
| | ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 7,000,000.00 |
| | ව්‍යාපෘතිය සදහා අපේකෂිත ප්‍රතිපාදන | 9,205,000.00 |
| | පරිපාලන වියදම් | 230,125.00 |
| | ව්‍යාපෘතිය සදහා අපේක්ෂිත මුළු ප්‍රතිපාදන මුදල | **9,435,125.00** |

## 14. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන පාර්ශවකරුවන්: -

| ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | නම | තනතුර | දුරකථන අංකය |
|---|---|---|---|
| සමෘද්ධි අමාත්‍යාංශය | නිලන්ත වික්‍රමනායක මයා | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 071 -8318434 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ | කෞෂිකා ගුණතිලක මිය | සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 071 - 1324822 |
| කෘෂිකර්ම දෙපාර්තමේනතුව | පුහුණු වැඩසටහන හා තාක්ෂණික උපදෙස් සඳහා ඉදිරියේදි සම්බන්ධ කර ගැනිමට අපේක්ෂිතයි. | | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්තොට | සි.එල්.තිලකරත්න මිය | සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | 071-8064757 |
| | වර්විල් කරුණාතිලක මයා | කෘෂිකර්ම සංවර්ධන නිලධාරී | 071-6038258 |
| | නයනා අබේරත්න මිය | කෘෂිකර්ම සංවර්ධන නිලධාරී | 071-1705949 |
| | හදමලී හරස්ගම මෙය | කෘෂිකර්ම සංවර්ධන නිලධාරී | 071 - 4682004 |
| | නිරෝෂි සුබසිංහ මෙය | සංවර්ධන නිලධාරී | 0777 - 007936 |

**15. ඉදිරිපත් කලේ:-** රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය සැලසුම් අංශය **දිනය :**

**16. නිර්දේශය :-** **දිනය :-**

**17. අනුමැතිය :-** **දිනය :-**